කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2022

2024 ඔක්තෝබර් / නොවැම්බර්

සමාජීය විද්‍යා පීඨය

මානවවිද්‍යාව
(නව නිර්දේශය)

# මානවවිද්‍යාව හැඳින්වීම ANTH 18214

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. මානවවිද්‍යාව යනු කුමක්දැයි හඳුන්වා දී, මානව විද්‍යාව විෂය හැදෑරීමේ කාලීන වැදගත්කම උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 20)

02 "සංස්කෘතිය වනාහි නිතර වෙනස්වන අනුවර්ථනශීලීය ක්‍රියාවලියකි." මෙම ප්‍රකාශය පහදන්න. (ලකුණු 20)

03. ප්‍රාග් නූතන සමාජයක කැපී පෙනෙන ලක්ෂණ හඳුන්වා දී ශ්‍රී ලංකාවේ වෙසෙන ප්‍රාග් නූතන සමාජයක් පිළිබඳව ප්‍රාමාණික විස්තරයක් කරන්න. (ලකුණු 20)

04. මානවවිද්‍යා කෞතුකාගාරයක් සතු ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කරමින්, ශ්‍රී ලංකාව තුළ මානවවිද්‍යා කෞතුකාගාර නිර්මාණය කිරීමට ඇති හැකියාව සාකච්ඡා කරන්න. (ලකුණු 20)

05. යම් ජනවර්ගයකට අයත් ආහාර වර්ග කිහිපයක් පිළිබඳව ඇති විශ්වාස හා මත පැහැදිලි කරන්න. (ලකුණු 20)

06. ශ්‍රී ලංකා සමාජය බහු සංස්කෘතික හා බහු ආගමික සමාජයක් ලෙස ද්‍රව්‍යාත්මක සාධක ඔස්සේ නිරූපණය වන්නේ කෙසේදැයි උදාහරණ සහිතව විමසන්න. (ලකුණු 20)

07. මානව විද්‍යාත්මක පර්යේෂණයන් සඳහා භාවිත කළ හැකි බහුමාධ්‍ය (Multimedia) මොනවාදැයි විස්තර කරන්න. (ලකුණු 20)

08. ශ්‍රී ලංකාවේ සංස්කෘතිය හැඩගැසීම සඳහා ආගමික බලපෑම කෙලෙස සිදුවී තිබේදැයි උදාහරණ සහිතව විමසන්න. (ලකුණු 20)

******************************